# රාජ්‍ය පාලනය තහවුරු කොට පවත්වාගෙන යාමේ දී පුරාතන ලාංකේය සමාජය විසින් වැදගත් කොට සලකනු ලැබූයේ පාලකයාගේ ජාතිකත්වය ද? නො එසේ නම් ආගමික නැඹියාව ද?

එම්. කේ. එල්. අයිරාංගනී[1]

## හැඳින්වීම

නිශ්චිත භූමි ප්‍රදේශයක් ස්ථාවර වාසභූමිය කරගත් ජන සංඛ්‍යාවකගෙන් සමන්විත, සංවිධානාත්මක පාලනයක් සහිත ස්වාධීන පාලන ඒකකයක් වශයෙන් හඳුනා ගන්නා "රාජ්‍යය" පාලනය කිරීමේ දී එකී පාලනයට සහභාගී වන පුද්ගලයන්ගේත් ඊට යොදා ගන්නා සම්පත්වලත් අනෙකුත් භෞතික පාරිසරික සහ සමාජීය හේතූන් මතත් විවිධාකාර ගැටුම් ඇති වේ. මානව ශිෂ්ටාචාරය ආරම්භයේ පටන් ම වරින්වර ඇති වූ මෙවැනි ගැටුම් පිළිබඳ අධ්‍යයනයේ දී ඊට ජාතිකත්වය (Nationality) සහ ආගම (Religion) යන සාධක මූලිකව ම බලපා ඇති බව හඳුනා ගත හැකි ය. ඒ අනුව රාජ්‍යයක පාලකයාගේ ජාතිකත්වය සහ ආගම එකී රාජ්‍යයේ ජනතාවගේ ජාතිකත්වය සහ ආගම යන සාධකය සමග අන්තර්සබඳතාවකින් යුක්ත බව ගම්‍යමාන වේ. සංවිධිත පරිපාලන රටාවක් බිහි වූ අනුරාධපුර අවධියේ පටන් ම රාජ්‍ය පාලකයා සහ ජනතාව අතර පැවති සබඳතාවන්හි දී ද ඉහත සාධක ද්විත්වය වරින් වර ඉස්මතු වූ අතර, එය විශේෂයෙන් හඳුනා ගත හැකි වන්නේ විදේශීය ආක්‍රමණික පාලකයන් හෙවත් විජාතිකයන් බලයට පත් වූ අවස්ථාවන් ය.

## පර්යේෂණ අරමුණ

බහුතර සිංහල බෞද්ධ ජන ප්‍රජාවකගෙන් යුත් ශ්‍රී ලංකාවේ රාජ්‍ය බලයට පත් විජාතික සම්භවයක් සහිත පාලකයින් කෙරෙහි බලපෑ ආගමිකත්වය සහ ජාතිකත්වය යන සාධක ද්විත්වය අතුරින් ප්‍රමුඛ වූ සාධකය හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන අතර, රජරට ශිෂ්ටාචාර අවධියේ දී මෙරටට එල්ල වූ විදේශීය ආක්‍රමණ, ආක්‍රමණ හමුවේ දේශීයයන්ගේ ක්‍රියාකලාපය, බුදුදහම සහ අන්‍ය ආගම් පරිපාලනය සමග පැවති සබඳතාවන් ආදිය හඳුනා ගැනීම උප අරමුණු වශයෙන් දැක්විය හැකි ය.

## පර්යේෂණ ක්‍රමවේදය

මහාවංශය, දීපවංශය ආදී වූ ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රය සහ සෙල්ලිපි මූලාශ්‍රයන් ඇසුරු කරමින් ඓතිහාසික ලේඛනගත සාධක සපුරා ගන්නා මෙම පර්යේෂණයේ දී ඓතිහාසික සංසන්දනාත්මක ක්‍රමවේදය ඔස්සේ සාධක විශ්ලේෂණය කරනු ලබයි.

## පර්යේෂණ ගැටලුව

පුරාතන ලාංකේය පාලන තන්ත්‍රය තුළ බලයට පත් විජාතික පාලකයින් හමුවේ වැදගත් වූයේ ඔවුන්ගේ විජාතිකත්වය ද? නැතහොත් ආගමිකත්වය ද?

[1]. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. *iranganimkl@yahoo.com*

**පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය**

පුරාතන ලාංකේය දේශපාලන සන්දර්භය තුළ පාලනයට පිවිසි විජාතික පාලකයින් සහ ඔවුන් බුදුදහම කෙරෙහි ක්‍රියාත්මක වූ අන්දම රාජත්වය, රාජ්‍යය සහ ආගම කෘතියේ දී හඟුරන්කෙත ධීරානන්ද හිමි විසින් විස්තර කරන අතර, ලෙස්ලි ගුණවර්ධන ශූරීන් ද සිවුර සහ නඟුල කෘතියේ දී පාලකයන් සහ ආගම අතර පැවති සබඳතාව ගැඹුරින් විග්‍රහ කර ඇත. ශ්‍රී ලංකාවට බුදුදහම හඳුන්වා දීමත් සමඟ දේශීය පාලන තන්ත්‍රයේ ඇති වූ වෙනස්කම් සංක්ෂිප්ත ලංකා ඉතිහාසයක් කෘතියේ දී පෙන්වා දීමට ඇස්. පරණවිතානයන් සහ සී.ඩබ්. නිකොලස් විසින් උත්සුක වී ඇත. ලක්දිව බුදුසමයේ ඉතිහාසය ග්‍රන්ථය රචනා කරන වල්පොළ රාහුල හිමියන් ද ද්‍රවිඩ සම්භවයක් සහිත පාලකයින් දේශීයන්ගේ ප්‍රසාදය හිමි කර ගැනීම පිණිස කටයුතු කළ ආකාරය විස්තර කර ඇති අතර, ඉන්ද්‍රකීර්ති සිරිවීර, අමරදාස ලියනගමගේ, සුමනසිරි වාච්චගේ වැනි විද්වතුන්ගේ මතවාදයන් ද මෙහි දී වැදගත් වේ. මෙම පර්යේෂකයින්ගේ අදහස් සහ මතවාදයන් අධ්‍යයනයේ දී බහුතරයක් වූ බෞද්ධයින්ගේ සහයෝගය දිනා ගනුවස් විජාතික සම්භවයකින් යුත් පාලකයින් බුදුදහමට අනුග්‍රහ දක් වූ අවස්ථාවන් ඔවුන්ගේ අවධානයට යොමු වී ඇති බව හඳුනා ගත හැකි වුවත් දේශීය පාලන තන්ත්‍රය ඔවුන්ගේ විජාතිකත්වය හෝ ආගමිකත්වය යන සාධකයන් ද්විත්වය කෙරෙහි බලපෑ අන්දම අවධානයට ලක් නො වූ බව හඳුනා ගත හැකි විය. මේ අනුව පරිපාලනයේ දී ජාතිකත්වය සහ ආගමිකත්වය යන සාධක ද්විත්වය අතරින් වඩාත් ඉස්මතු වූයේ කුමන සාධකය ද? යන පර්යේෂණ රික්තකය ඔස්සේ මෙම පර්යේෂණය මෙහෙයවනු ලබයි.

**පර්යේෂණ සාකච්ඡාව**

යම්කිසි සමාජ සංවිධානයක් නිශ්චිත භූගෝලීය ඒකකයක් තුළ පැතිරෙමින් එක් නායකත්වයක් වටා තම රාජ්‍ය බලය පිහිටුවා ගැනීමේ දී එහි නායකත්වය පත්වන පුද්ගලයා සමස්ත ජන කණ්ඩායමේ ම පොදු නියෝජනයක් බවට පත් වේ. බහුතර ජන ප්‍රජාව සහ සුළුතර කණ්ඩායම් නායකත්වය වටා ඒකරාශී වන හෙයින් පාලිතයන් විසින් අපේක්ෂා කරන යම් යම් නිර්ණායකයන් පාලකයෙකු සතුව තිබීම අත්‍යවශ්‍ය වේ. පුරාතන ලාංකේය ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී සිංහල බෞද්ධ යැයි පිළිගත් දේශීය රාජාණ්ඩුව තුළ සිහසුන් ගත වූ විජාතික, අන්‍යාගමික පාලකයින් කිහිපදෙනෙකු හඳුනා ගත හැකි වේ. බුදුදහම කේන්ද්‍ර කොටගත් බහුතර සිංහල ප්‍රජාවකගෙන් සැදුම්ලත් දේශයක් පාලනය කිරීමේ දී එම පාලකයන් මුහුණපෑ අභියෝග ඔස්සේ පරිපාලනය කෙරෙහි වැදගත් වූයේ ජාතිකත්වය ද නැතහොත් ආගමිකත්වය ද යන්න අධ්‍යයනය කළ හැකි වේ.

සූරතිස්ස (ක්‍රි.පූ.247-237) රාජ්‍ය සමයේ දී මෙරට පාලන බලය අත්පත් කරගන්නා සේන සහ ගුත්තික නමැති ද්‍රවිඩ වෙළෙඳුන් දෙදෙනා පිළිබඳ ව විස්තර කරන <u>මහාවංශය</u> 'ධම්මෙන' යනුවෙන් ද වංසත්ථප්පකාසිනිය "ධම්මෙන කාරයුං" යනුවෙන් ද දක්වන අතර, මෙමඟින් ප්‍රවේණිධර්මය නොයික්මවමින් රාජ්‍යය කළාහු ය යන්න ප්‍රකාශ වී ඇත. ප්‍රවේණිධර්මය හෙවත් පෙරසිරිත යනුවෙන් බදුලු ටැම්ලිපිය, මිහින්තලේ පුවරුලිපිය සහ සාහිත්‍ය මූලාශ්‍රයන්හි හඳුන්වා ඇත්තේ මහින්දාගමනයත් සමඟ ඇති වූ ස්වදේශික විධිමත් පරිපාලන තන්ත්‍රය තුළ පූර්ව පාලකයින් විසින් සම්මත කරගත් ප්‍රතිපත්තීන් අනුව බුදුදහමට අවනත පරිපාලනයක් රැගෙන යාම යි. ඒ අනුව සේන, ගුත්තික නම්

විජාතික පාලකයින් දෙදෙනා විසින් පෙර සිරිත අනුගමනය කළ බවට ඇති සාධක අනුව ඔවුන් බුදුදහම වැළඳගත්, ශාසනයට අනුග්‍රහය දක් වූ පාලකයින් බව තහවුරු වේ.

අනුරාධපුරයේ රාජත්‍වයට පත් වූ පසු පෙර සිරිත් අනුගමනය කරමින් සැගිරියට ගොස් මහා සඞ්ඝයා වැඳපුදා ගන්නා එළාර රජු (ක්‍රි.පූ.205-161) තම රථයෙහි වැදීමෙන් චෛත්‍යයක කොටසක් බිඳුනු පසු තමන්ගේ ම හිස ගසා දමන ලෙස ඉල්ලීම හරහා ඔහු බුදුදහම කෙරෙහි දක්වා ඇති ගෞරවය පැහැදිලි වේ. විශේෂයෙන් ම බෞද්ධ භික්ෂුවක වූ මහානාම හිමි එළාර පිළිබඳ ව මහාවංශයේ සටහන් කිරීමේ දී එළාර යනු ධර්මිෂ්ඨ පාලකයෙකු ලෙස දක්වීම තුළ අපක්ෂපාතී ව එළාරට සාධාරණත්‍වයක් ඉටු කිරීමට පෙළඹී ඇති අතර, එසේ සිදු වන්නට ඇත්තේ වසර හතළිස් හතරක් පුරා ගැටුම් අවම කර ගනිමින් පාලනයක් පවත්වාගෙන යෑමට එළාර විසින් බෞද්ධයින් තුළ තමන් පිළිබඳ ව ආකර්ෂණීයභාවයක් ඇති කළ හෙයිනි.

ක්‍රි.ව. පස්වැනි ශතවර්ෂයේ දී මෙරට ආක්‍රමණය කර වසර 27ක් පුරා පාලනය ගෙන ගිය ද්‍රවිඩ පාලකයන් අතරින් බුද්දපාරිඳ රජුට (ක්‍රි.ව.441-447) අයත් අභයගිරි සෙල්ලිපියෙහි එම ද්‍රවිඩ පාලකයා **"බුදධස ළ පරිදෙව"** යනුවෙන් හඳුන්වා තිබීමෙන් බුද්ධදාස යන බෞද්ධ විරුදනාමය තමන්ට ආරෝපණය කර ගැනීමට ආක්‍රමණික පාලකයන් කටයුතු කළ ආකාරය පැහැදිලි වේ. බුද්දපාරිඳ රජුගේ බිසව විසින් බෞද්ධ විහාරයකට සිදු කළ පූජාවක් සම්බන්ධව මෙම සෙල්ලිපියේ සඳහන් ව තිබීම ද වැදගත් වේ. පාරිඳ නම් රජු (ක්‍රි.ව.441-441) ද තමන් විසින් කරන ලද පූජාවක් සම්බන්ධ ව අරගම සෙල්ලිපියක සඳහන් කරන අතර, කතරගමින් ලැබුනු සෙල්ලිපියක සඳහන් වන්නේ ද්‍රවිඩ පාලකයෙකු වූ දාඨිය රජු (ක්‍රි.ව.447-450) විසින් කතරගම මඞ්ගල මහා චෛත්‍යයට කරන ලද පූජාවක් සම්බන්ධව යි. මේ අනුව අනුරාධපුර අවධියෙහි පාලන බලය අල්ලා ගනිමින් පාලන හිමි කරගත් විජාතික පාලකයන් දේශීයන් අවනත කර ගැනීමේ හස්තය වශයෙන් බෞද්ධ නාමයන් භාවිත කිරීමත් පූජාවන් සිදු කිරීමත් ආදිය හඳුනා ගත හැකි වේ.

පොළොන්නරු අවධිය වෙත අවධානය යොමු කිරීමේ දී ආක්‍රමණික ද්‍රවිඩ පාලකයෙකු වූ පළමුවැනි රාජේන්ද්‍ර චෝළ (ක්‍රි.ව.1017-1044) විසින් වෙල්ගම්වෙහෙර විහාරයට ප්‍රදානයක් සිදු කළ බව එම විහාරභූමියට අයත් සෙල්ලිපියකින් තහවුරු වේ. එපමණක් නො ව කාලිඞ්ගදේශයේ සිට මෙරටට පැමිණි කීර්ති ශ්‍රී නිශ්ශඞ්කමල්ල රජු (ක්‍රි.ව.1187-1196) තම විජාතිකත්‍වය සම්බන්ධ ව ක්‍රියා කළ ආකාරය එතුමන්ගේ සෙල්ලිපි මගින් පැහැදිලි ව හඳුනා ගත හැකි වේ. **"බුදුන් සක්විත්තන් උපදනා උතුම් දඹදිව කළිඟු රටැ සිංහපුරයෙහි"** තමන් සම්භවය ලත් බව දක්වන නිශ්ශඞ්කමල්ල රජු එමගින් බුදුදහම උපන් දේශයේ තමන් උපන් හෙයින් ද විජය කුමරුන් හා සම්බන්ධ සිංහපුරයට නෑකම් දක්වන හෙයින් ද දේශීය රාජ්‍යයේ හිමිකම උදෙසා තමා වඩාත් සුදුසු බව අවධාරණය කරමින් 'සිරිසඟබෝ' යන බෞද්ධ නාමය ද භාවිත කර තිබේ. එතුමන්ට අනතුරු ව පාලන බලයට පත්වන සහස්සමල්ල රජු (ක්‍රි.ව.1200-1202) ද තම කාලිඞ්ග සම්භවය උත්කර්ෂයට නගන්නේ බුදුදහම සමඟ කාලිඞ්ගදේශය සම්බන්ධ කරමිනි.

මේ අනුව පූජාවලියෙහි සඳහන්වන පරිදි "**මේ ලක්දිව බුදුන්ගේ ම තුනුරුවන් භාණ්ඩාගාරයක් වැන්න. එසේ හෙයින් මේ ලක්දිව මිථ්‍යාදෘෂ්ටිගතුවන්ගේ වාසය නම් පෙර යක්‍ෂයින්ගේ වාසය ස්ථිර නූවූවා සේ ම ස්ථිර නො වේ ම ය. මිථ්‍යාදෘෂ්ටි ගත් රජෙක් ලක්දිව බලහත්කාරයෙන් කිසි කලක රාජ්‍ය කළේ වී නමුත් ඔවුන්ගේ වංශප්‍රතිෂ්ඨා නො වනු බුදුන්ගේ ආනුභාව විශේෂයක් ම ය. එසේ හෙයින් මේ ලක්දිව සම්‍යක් දෘෂ්ටි ගත් රජුන්ටම සීගෙන හෙයින් උන්ගේ කුල ප්‍රවේණිය පවත්නේ ද ඒකාන්තයෙන් ම ය.**" යනාදී වශයෙන් දේශීය සිහසුනට උරුමකම් කීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ පාලකයා බෞද්ධයෙකු වීම යි. හතරවැනි මිහිඳු රජුගේ (ක්‍රි.ව.956-972) ජේතවනාරාම සෙල්ලිපියට අනුව පාත්‍රා ධාතුව සහ චීවර ධාතුව රක්නා පිණිස සඞ්ඝයා විසින් බෝධිසත්ව පාලකයන් ලංකා රාජ්‍යයෙහි පිහිටවනු ලැබීම ද විජාතික පාලකයින් බුදුදහම වැළඳ ගැනීමට ප්‍රධාන හේතුවක් වී තිබේ.

**පර්යේෂණ නිගමනය**

රජරට ශිෂ්ටාචාර අවධියේ දී බලයට පත් විජාතික සම්භවයක් සහිත පාලකයින් තම විජාතිකත්වය බුදුදහම සමග සම්බන්ධ කරමින් තමන්ට ද බුදුදහම ආරක්‍ෂා කිරීමේ වගකීමක් සහජයෙන් ම උරුම ව ඇති බව ප්‍රකට කර ඇති අතර, බෞද්ධ නාමයන් සහ අනුග්‍රහයන් භාවිත කරමින් බෞද්ධයින්ගේ ආකර්ෂණය දිනා ගැනීමට සමත් වී තිබේ. මේ අනුව තහවුරු වන්නේ පාලකයෙකුගේ ජාතිකත්වය අභිභවා යමින් දේශීය සමාජ සන්දර්භය තුළ ආගමිකත්වය යන සාධකය ඉස්මතු වූ බව යි.

**ප්‍රමුඛ පදඃ-** පාලකයා, බුදුදහම, පාලනය, පුදපූජා, ජාතිකත්වය

මූලාශ්‍රය


- Paranavitana, S. (ed.). (1987). **Epigraphiya Zelanica**. Vol. III. London: Oxford University Press.
- Paranavitana, S. (ed.). (1943). **Epigraphia Zeylanica**.Vol. IV. London: Oxford University Press.
- **පූජාවලිය.** (1926). කොළඹඃ ජිනාලඞ්කාර මුද්‍රණාලය.
- ශ්‍රී සුමංගල හිමි, හික්කඩුවේ සහ වෙනත් (සංස්.). (2007) **මහාවංශය**. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- අමරවංශ හිමි, අකුරටියේ සහ දිසානායක, හේමචන්ද්‍ර (සංස්.). (2001). **වංසත්ථප්පකාසිනී.** කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- මුදියන්සේ, නන්දසේන (1997). **ලංකාවේ ද්‍රවිඩ සිහිවටන.** කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- ධීරානන්ද හිමි, හගුරන්කෙත (2004). **රාජත්වය, රාජ්‍යය සහ ආගම.** වරකාපොලඃ ආරිය ප්‍රකාශකයෝ.
- රාහුල හිමි, වල්පොළ (2002). **ලක්දිව බුදුසමයේ ඉතිහාසය.** කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.